16


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1,423/6 – 2005 දෙසැම්බර් 13 වැනි අඟහරුවාදා – 2005.12.13

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 21/78V.

#### 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 24අ වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2005 නොවැම්බර් මස 02 වැනි දින දී ය.

#### නියමාවලිය

1. මේ නියමාවලිය 2005 අංක 4 දරන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 2005.10.01 දින සිට බලාත්මක වන්නේය.

2. මේ නියමාවලිය, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24අ වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් කරන ලදුව 2005 ඔක්තෝබර් මස 31 වැනි දින අංක 1417/12 දරන අති *විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් පිහිටුවන ලද (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන), පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට අදාළ වන්නේ ය.

3. මේ ආයතනය (මෙහි මින් මතු " විශ්ව විද්‍යාලය " යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයට අනුබද්ධ වන්නේ ය.

4. පනතේ විධිවිධානවලට සහ (මෙහි මින්මතු "කොමිෂන් සභාව " යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විධානයට සහ පාලනයට යටත්ව, ආයතනයට පහත සඳහන් කටයුතු සඳහා බලය ඇත්තේය ; එනම් :

(අ) ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම ;

(ආ) ඉංග්‍රීසි භාෂා ක්ෂේත්‍රයේ පාඨමාලා පැවැත්වීම ;

(ඇ) ආයතනයේ සහ විශ්ව විද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි පරිදි ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම, පුහුණු කිරීම, පර්යේෂණ කිරීම සහ වැඩිදියුණු කිරීම සහ උපදේශනය සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඈ) අදාළ අධ්‍යයන ක්ෂේත්‍රවල ප්‍රවීණතාව අත්කරගෙන සිටින තැනැත්තන් නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා විශ්ව විද්‍යාලයේ අනුමතය ඇතිව විභාග පැවැත්වීම සහ ව්‍යවස්ථාවලින් නියමිත අනෙකුත් කොන්දේසි සපුරා, උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ විශ්ව විද්‍යාලයේ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කරනු ලැබීම සඳහා සුදුසුසන්ව සිටින තැනැත්තන්, විශ්ව විද්‍යාලයට නිර්දේශ කිරීම ;